# පොල්පලා වගාව තුළින් අළුත් ආදායම් මාර්ග කරා........

**ශ්‍රී ලංකාවේ ගොවීන්ට සැමදා ඇති ප්‍රශ්නයක් වන්නේ තම නිෂ්පාදන වලට සරිලන මිලක් නොලැබීමයි.** වර්තමානයේ වියලි කලාපයේ ජලය නොමැතිව වගා නොකර හැර දමා ඇති ඉඩම්වල **පොල්පලා** වැනි බෝග වගා කිරීම සම්බන්ධව තවදුරටත් උනන්දු වීම තුළින් අඩු ශ්‍රමයක් සහ අඩු පිරිවැයක් යටතේ සාර්ථක වූ ආදායම් මාර්ගයක් සලසා ගත හැකිව තිබේ.

**ශ්‍රී ලංකාවේ දිළිඳු ජනයාගෙන 90% ක්ම ගැමියන් වන අතර ඔවුන්ගේ ප්‍රධානම ජීවනෝපාය වන්නේ කෘෂිකර්මය යි. 2003 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකාවෙහි සමස්ථ ආර්ථික ව්‍යුහයෙහි වර්තමාන තත්ත්වය අනුව, දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකර්මයෙහි දායකත්වය 1991-2000 කාල පරාසය තුළ දී 23% කි. 2001-2003 කාල පරාසය වන විට එම අගය 20% දක්වා අඩු ව පවතී.** මේ සඳහා බලපෑ ගැටළු අතරින් සමහරක් වන්නේ කාෂිකර්ම ව්‍යාප්ති සේවය දුර්වල වීම, වැඩි අස්වනු ලබාදෙන බීජ ප්‍රභේදයන් ප්‍රමාණවත්ව නොතිබීම, පසු අස්වනු නාස්තිය ඉහළ මට්ටමක පැවතීම, අලෙවි දුෂ්කරතා, වගාකල හැකි ඉඩම් වල පවතින සීමාවන් යනාදිය යි. මේ කරුණු නිසා කෘෂිකර්මාන්තයෙන් යැපෙන ගොවීන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කරගත හැකි අන්දමේ ක්‍රමෝපායයන් කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කරලීමේ කාලීන අවශ්‍යතාවයක් පවතී.

**සන්ධ්‍යා සේනානායක**
**සංඛ්‍යාන නිළධාරිණී**
**කෘෂි කාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

මෙම ගැටළු අතුරින් දේශීය කෘෂි කර්මාන්තයේ නියැලෙන ගොවීන්ගෙන් නිරන්තරයෙන්ම ඉදිරිපත් කෙරෙන ප්‍රධාන ගැටළුව වන්නේ ඔවුන්ට තම නිෂ්පාදන වලට ප්‍රමාණවත් මිලක් නොලැබීම යි. ගොවිපල මිල අවම වීම හා අවසානයේ දී පාරිභෝගිකයා විසින් ඉතා ඉහළ මිලක් ගෙවිය යුතු වීම, අලෙවිකරණ ක්‍රියාවලියේ දක්නට ලැබෙන අකාර්යක්ෂමතාවයකි. විවෘත ආර්ථික ක්‍රමය යටතේ, සමස්ථ අලෙවි ක්ෂේත්‍රයේ වැඩි කාර්යභාරයක් පෞද්ගලික අංශය දැරීමත් සමඟ පැවති සාම්ප්‍රදායික ක්‍රමයෙහි මුහුණුවර වෙනස් වීමක් දක්නට ලැබේ.

අලෙවිකරණ ගැටළුවෙහි ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය ගත් විට ඉන් වැඩි බලපෑමක් සිදුව ඇත්තේ සුළු ගොවීන්ට බව පෙනී යයි. දහසකුත් ප්‍රශ්න මැද ජීවන අරගලය ගෙනයාම සඳහාම කරනු ලබන කුමන හෝ කෘෂි නිෂ්පාදනයක් අලෙවි කර ලබා ගන්නා ආදායම, තම වියදම් වලට හෝ ප්‍රමාණවත් නොවීමේ ප්‍රශ්නයට ඔවුහු මුහුණ පා සිටිති. මෙහි අවසන් ප්‍රතිඵලය වන්නේ ණය බරින් නිදහස් වීමට නොහැකි වීම හා/හෝ සියදිවි නසා ගැනීමයි. **හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය** පුත්තලම දිස්ත්‍රික්කයේ කරන ලද ක්‍රියාකාරී පර්යේෂණයක් අනුව, ඉහත කී කෘෂි අලෙවි ප්‍රශ්නයෙන් කාලයක් තිස්සේ බැට කෑ ගොවි පිරිසක් විකල්ප මාර්ගයක් කෙරෙහි යොමු වී ශුභවාදී අයුරින් එල නෙලා ගත් ආකාරය පහතින් සඳහන් වේ. කටුක දේශගුණික තත්ත්වය නිසා කන්න කිහිපයක දී කිසිදු වගාවක් කර ගැනීමට අසමත් ව සිටි **පුත්තලම දිස්ත්‍රික්කයෙහි (තබ්බෝව, වනාතවිල්ලුව, කරුවලගස්වැව සහ ඉහල පුළියන්කුලම** වැනි) ප්‍රදේශ කිහිපයක ගොවීන්, එම කටුක දේශගුණයට ඔරොත්තු දෙන ඖෂධීය පැලෑටියක් වූ පොල්පලා වගාවට යොමුව තිබීම ඔවුන් තෝරාගෙන තිබූ විකල්ප ගොවිතැන වශයෙන් හඳුන්වා දිය හැකිය.

කලක් තිස්සේ එම ගොවීන් හුරුපුරුදු වී තිබුනේ නිදැල්ලේ වන ලැහැබ්වල සරුවට වැඩුන පොල්පලා එක් රැස් කර පවත්නා මිලකට අලෙවිකර ආදායමක් ලබා ගැනීමයි. මේ වන විට වියළි පොල්පලා කිලෝවක් සඳහා අතරමැදි වෙළඳුන් ඔවුනට ගෙවා ඇත්තේ කිලෝවකට රු.8.00-10.00 (1996 වනවිට) අතර වූ මිලකි.

මේ අතර **හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ** කෘෂි ද්‍රව්‍ය අලෙවිකරණය සඳහා වූ ක්‍රියාකාරී ව්‍යාපෘතිය යටතේ, පොල්පලා කිලෝවක් සඳහා ගොවීන් ළඟටම ගොස් කිලෝවකට රු.20.00-30.00 අතර ඉහළ මිලක් ගෙවීමට කැමති පෞද්ගලික ආයතන සම්බන්ධ කරවීමෙන් ගොවීන්ගේ ආදායම සැළකිය යුතු ලෙස ඉහළ නැංවිය හැකි විය. මෙම ප්‍රවණතාවයත් සමඟ ප්‍රදේශයේ අත්හැර තිබූ ඉඩම්වල පොල්පලා වගාව අළුතින් ද ඇරඹිණි. වගා ව්‍යාප්තිය සඳහා අවශ්‍ය බීජ සහ උපදෙස් ලබා දීමට පවා පෞද්ගලික ආයතන කිහිපයක්ම කැමැත්ත පළකරන ලදී. අඛණ්ඩ වෙළඳපොලක් සහ හොඳ මිලක් ලැබීම තුළ ගොවීන් නිතැතින්ම මෙම වගාවට යොමු වීමක් පැහැදිලිවම දැකිය හැකි විය.

පොල්පලා වගාව සඳහා රසායනික බෙහෙත්, පොහොර ආදිය විශේෂයෙන් යෙදීම අනවශ්‍ය බැවින් දැරිය යුතු පිරිවැය අවම මට්ටමක පවත්වා ගත හැක. රෝපණ අවධියෙන් මාස 3- 3 1/2ක් තුළ පළමු අස්වැන්න ලබා ගත හැකි අතර මුල ඉතිරි වන සේ (ගොයම් කපන පරිදි) කපා ගත් විට නැවත මාස 3කින් පමණ ඉන් දෙවැනි වර අස්වැන්න

(22 වෙනි පිටුවට.....)

(13 වෙනි පිටුවෙන් .....)

## පොල්පලා වගාව......

නෙලා ගත හැකිය. ඉන් අනතුරුව, තුන් වන අවස්ථාවේ දී ගස පිටින්ම උදුරා අස්වනු ලබා ගැනීම සිදු කෙරේ. ඒ වන විට පොල්පලා ඇට බිම වැටී නැවත පැලවීම සිදුවන බැවින් බීජ සඳහා අමතර පිරිවැයක් යෙදීම මඟ හැරේ. මෙම පැල වලින් වැඩි පැල වෙනත් ඉඩම්වල වගාව සඳහා යොදාගත හැකිය. නව වගාවක දී පැල අතර පරතරය අඩි 1x1 පමණ වීම ප්‍රමාණවත් ය. මෙතෙක් පොල්පලා වගාව සඳහා කෘෂි ව්‍යාප්ති සේවාවක් හෝ උපදේශක සේවාවක් හෝ හඳුන්වා දී නොමැති අතර මෙය ඉහළ ආදායමක් ඉපයිය හැකි ආර්ථික බෝගයක් ලෙස හඳුන්වා දීමට පුළුවන.

මෙයට මැදිහත්ව සිටි පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයන්ගේ අදහස වූයේ මෙය අපනයන බෝගයක් ලෙස ද දියුණු කළ හැකි බවයි. දැනටමත් **රුසියාව** වැනි රට වලින් පොල්පලා සඳහා ඉහළ ඉල්ලුමක් පවතී.

පොල්පලා වලට පවත්නා මෙම තත්ත්වය සලකා බැලීමේ දී මෙම වගාවෙහි ව්‍යාප්ති කටයුතු ඉතා පහසුවෙන් සිදුකළ හැකි අතර අපනයන වගාවක් ලෙස දියුණු කරලීමට ඇති ඉඩ ප්‍රස්ථා පිළිබඳව සොයා බලා දිරි ගැන්වීම ආදිය සඳහා ක්‍රමවත් ව්‍යාපෘති වැඩපිළිවෙලක් සකස් කළ යුතු වේ. අතහැර දමා ඇති ඉඩම් වලින් ආදායම් උත්පාදනය කර ගත හැකි පහසු මගක් ලෙස ද මෙය හඳුන්වා දීම තිවැරදිය.